# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1,783/27 - 2012 නොවැම්බර් මස 09 වැනි සිකුරාදා - 2012.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### පඩිපාලක සභා ආඥාපනත

නිවේදනයයි

**ගිනි පෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා ආඥාපනතේ, 30 වැනි වගන්තියෙන් ගිනි පෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් ඒ උපලේඛනයෙහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට එම පඩිපාලක සභාව අදහස් කරන බව එකී ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන විරෝධතා 2012 දෙසැම්බර් මස 04 වැනි දින, මධ්‍යාහ්න 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් භාරගනු ලැබේ.

ඉදිරිපත් කරනු ලබන සෑම විරෝධතාවයක්ම එසේ විරුද්ධ වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද සහිතව ලියවිල්ලකින් විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
ගිනි පෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2012 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

ගිනි පෙට්ටි සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1947 මැයි මස 30 වැනි දින අංක 9,708 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇත්තාවූ ද, කලින් කල වෙනස් කරන ලද්දාවූ ද, අවසන් වරට, 2010 ජුනි මස 30 වැනි දින අංක 1,660/35 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද නිවේදනයෙන් වෙනස් කරන ලද්දාවූ තීරණ, එම උපලේඛනයේ II වැනි කොටස වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

1A - G 16856— 340 (2012/11)

*II වැනි කොටස*

**1 කාල මිම්මේ වැඩ සඳහා වූ අවම වේතන ප්‍රමාණය**

I වැනි තීරයෙහි නිශ්චිතව සඳහන් කම්කරුවන්ට වැඩ කරන සාමාන්‍ය දිනකට අදාළ විය යුතු අවම වේතන ප්‍රමාණය II වැනි තීරයෙහි අනුරූප සටහනෙහි දැක්වෙන ප්‍රමාණය විය යුතු ය.

| *I වැනි තීරය* *කම්කරුවන්ගේ පන්තිය* | *II වැනි තීරය* *දිනකට ගෙවිය යුතු ප්‍රමාණය* *(රු. ශ.)* |
|---|---|
| *1 වැනි ශ්‍රේණිය* | |
| මැෂින් ඩ්‍රයිවරයෙන් කුරු කැපීම, මැෂින් ඩ්‍රයිවරයෙන් කුරුපට්ට, ලාච්චු පතුරු, පෙට්ටි පතුරු හා අඩි පතුරු කැපීම, මැෂින් ඩ්‍රයිවරයෙන් පිහියා හා මෙවලම් මුවහත් කිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් රූප රාමුවල කුරු සවි කිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් කුරුවලට බෙහෙත් පෙවීම, මැෂින් ඩ්‍රයිවරයෙන් පෙට්ටිවලට බෙහෙත් ගෑම, මිශ්‍රණයෙන් ගිනි කුරු බෙහෙත් කවලම් කිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් කඩදාසි කුරු කැපීම, ඕවර්සියර් හෝ කංකානම් වැඩ, මැෂින් ඩ්‍රයිවරයෙන් පෙට්ටි පිරවීම | 380 00 |
| *2 වැනි ශ්‍රේණිය* | |
| අතින් හරස් අතට කපා කුට්ටි කිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් හරස් අතට කපා කුට්ටි කිරීම, කුරු මට්ටම් කිරීම, කපනයෙන් ලාච්චු පතුරු, පෙට්ටි පතුරු, අඩි පතුරු කැපීම, යන්ත්‍රානුසාරයෙන් පෙට්ටි ලාච්චු සෑදීම, අත් උදව්කාරයෙකු මඟින් යන්ත්‍රානුසාරයෙන් පිහියා හෝ මෙවලම් මුවහත් කිරීම, කුරුවලට අතින් පැරපින් තෙල් පෙවීම, රාමුවලින් කුරු හලා ගැනීම, පෙට්ටි අංශවල බෙහෙත් ගෑම, පිරවූ පෙට්ටි පරීක්ෂා කිරීම, මැෂින් ඩ්‍රයිවරයෙන් මුද්‍රා පටි ඇලවීම, පෙට්ටි අංශවල ගානා බෙහෙත් කවලම් කිරීම, පිට පෙට්ටි යන්ත්‍රයෙන් සෑදීම, පෙට්ටි පිරවීමට යන්ත්‍රානුසාරයෙන් පෙට්ටි යැවීම, බෙහෙත්වලට අතින් කුරු එබීම. | 365 00 |
| *3 වැනි ශ්‍රේණිය* | |
| කාවල්කාර වැඩ හැර ඉහත I වැනි ශ්‍රේණියේ හෝ 2 වැනි ශ්‍රේණියේ නිශ්චය කොට නැති (ගිනි පෙට්ටි තැනීමේ ව්‍යාපාරයේ) සිය කම්කරුවන්ගේ වැඩ | 350 00 |
| *4 වැනි ශ්‍රේණිය* | |
| කාවල්කාර වැඩ | 380 00 |

11 - 866/1

---

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**සුරුට්ටු සෑදීමේ කර්මාන්තය**

(136 වැනි අධිකාරය වන) පඩිපාලක සභා අඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයේ නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එහි දක්වා ඇති පරිද්දෙන් වෙනස් කිරීමට සුරුට්ටු සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව, මෙයින් නිවේදනය කරනු ලැබේ.

යෝජිත තීරණය පිළිබඳව දැක්වෙන විරෝධතාවයන් 2012 දෙසැම්බර් මස 04 වැනි දින දහවල් 12.00 දක්වා මා විසින් භාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, එසේ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක්ද ඊට අඩංගු විය යුතු ය.

වී. බී. පී. කේ. වීරසිංහ,
සභාපති,
සුරුට්ටු සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව.

2012 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ 05,
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය.

*උපලේඛනය*

සුරුට්ටු කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව, 1946 ජූලි මස 26 වැනි දින අංක 9,585 දරන *ගැසට් පත්‍රයේ* පළ වූ නිවේදනයේ උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තාවූ ද, කලින් කලට වෙනස් කරන ලද්දාවූ ද අවසන් වරට, 2010 ජූනි මස 30 වැනි දින අංක 1,660/35 දරන *අති විශේෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද දැන්වීම්වලින් වෙනස් කරන ලද්දාවූ ද තීරණ, එම උපලේඛනයේ I වැනි කොටස වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් කළ යුතු ය.

*I වැනි කොටස*

**කැලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන්**

(දුම්කොළ පිරිසිදු කිරීම, එතීම සඳහා එතීම් කොළ සකස් කිරීම, කැපූ දුම්කොළ පිරවීම ද සහිතව එතීම සඳහා දුම්කොළ සකස් කිරීම, ඔතන සුරුට්ටු නූලෙන් බැඳීම සහ සුරුට්ටු දහයේ මිටිවලට බැඳීම ද ඇතුළුව) සුරුට්ටු එතීම සඳහා කැලි ගණනේ වැඩවලට ගෙවිය යුතු අවම වැටුප් ප්‍රමාණයන්.

සුරුට්ටු 1000කට රු. 595.00ක් විය යුතුය.

11 - 866/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.